ස්ථාවර නියෝග අංක 119 (4) අනුව රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව පාර්ලිමේන්තුවේ සභාගත කරන ලද වාර්තාවේ සඳහන් නිරීක්ෂණ හා ගෙන ඇති ක්‍රියාමාර්ග ඉදිරිපත් කිරීම

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංකය : 183

ආයතනයේ නම : පරිසර අමාත්‍යාංශය

කමිටුව විසින් හඳුනාගෙන ඇති අඩුපාඩු	අඩුපාඩු නිවැරදි කර ගැනීම සඳහා ආයතනය ගෙන ඇති ක්‍රියාමාර්ග / වර්තමාන තත්ත්වය
2004 .05.11 දිනැති අංක 171/2004 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාර රජයේ වැටුප් සකස් කිරීමේ පරිගණක මෘදුකාංගයට අදාල පළමු, දෙවන සහ තෙවන මුරපද තුන්මසකට වරක් වෙනස් කර නොතිබුණි.	විවිධ ප්‍රායෝගික ගැටළු මත එවකට මෙය ක්‍රියාත්මක නොවුණ ද විගණන නිරීක්ෂණය අනුව අදාල මුරපද සකස් කර වැටුප් සකස් කිරීමේ පරිගනක මෘදුකාංගය ක්‍රියාත්මක කරනු ලබයි.
විගණකාධිපතිවරයා විසින් ඉදිරිපත් කර තිබූ සෑම විගණන විමසුමක් සඳහාම මසක් තුළ පිළිතුරු සපයා නොතිබුණි. අභ්‍යන්තර විගණන විමසුම් සඳහා මසක් තුළ පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි.	2020 වර්ෂයේ කොවිඩ් 19 වසංගතය පැතිරයාම හේතුවෙන් රට අගුළු දැමීමත්, රජයේ සියලු කාර්යාලවල රාජකාරි කටයුතු සිදුකිරීමේ දී ඇති වූ බාධාවන් හමුවේ චක්‍රීය පදනම මත රාජ්‍ය නිලධාරීන් රාජකාරි සඳහා කැඳවීමත් සිදුවිය. ඇතැම් අවස්ථාවලදී විගණන විමසුම් සඳහා පිළිතුරු සැපයීමේ දී වෙනත් රාජ්‍ය ආයතනවලින් ද තොරතුරු ලබාගෙන විවිධ අංශ මගින් සකස් කරන පිළිතුරු ඒකාබද්ධ කර අවසන් වාර්තාව සකස් කිරීමට සිදුවේ. එබැවින් විගණන විමසුම් සඳහා පිළිතුරු ලබාදීමට ප්‍රමාද වූ අවස්ථා පැවැති නමුත් මෙවැනි ප්‍රමාදයන් ඉදිරියේ දී සිදු නොවීමට කටයුතු කරමින් පවතී.
වාහනයක් ගර්හිත වී මාස 6 කට වඩා අඩු කාලයක දී අපහරණය කර නොතිබුණි.	මෙම අමාත්‍යාංශයේ භාවිතයෙන් ඉවත් කර අපහරණය සඳහා නිර්දේශ කරන ලද වාහන මෝටර් කාර්මික ශිල්පය හදාරනු ලබන සිසුන්ගේ ප්‍රායෝගික පුහුණු කටයුතු සඳහා ජාතික තරුණ සේවා සභාවට ලබාදීමට තීරණය කර තිබුණි. ඒ අනුව වැසි අංක ඉවත් කර ලියාපදිංචිය අවලංගු කර ඇති අංක 18 – 3797 දරන මෝටර් රථය ජාතික තරුණ සේවා සභාව වෙත මගේ අංක 02/02/ප්‍ර/01/Vol VI (Vehicle Disposal) හා 2020.02.28 දිනැති ලිපියෙන් පුහුණු කටයුතු සඳහා ලබා දී ඇත. අංක 18 – 1358 දරන මෝටර් රථය ද ලියාපදිංචිය අවලංගු කර ජාතික තරුණ සේවා සභාව වෙත මගේ අංක 02/02/ප්‍ර/01/Vol VI හා 2022.03.25 දිනැති ලිපියෙන් පුහුණු කටයුතු සඳහා ලබා දී ඇති නමුත් ඔවුන්ගේ ප්‍රවාහන අපහසුතා හේතුවෙන් මෙතෙක් රැගෙන ගොස් නොමැත. 2022.12.31 දින නැවත සිහිකැඳවීමක් ද යොමු කර ඇත.

අදාළ විධිවිධානවලට අනුකූලව රැස්කළ ආදායම් ආපසු ගෙවා නොතිබුණි.	මෙම අමාත්‍යාංශය ආදායම් උපයනු ලබන අමාත්‍යාංශයක් නොවේ. නමුත් ඇතැම් අවස්ථාවල දී ලද ටෙන්ඩර් තැන්පතු මුදල්, ව්‍යාපෘති වලින් ලද සුළු ආදායම් ගිණුම් සාරාංශ මගින් මාසිකව රජයේ ආදායමට බැර කිරීමට කටයුතු කර ඇත.
සමස්ත කාර්ය මණ්ඩලයම ඇතුලත්ව කාර්ය සාධන ගිවිසුම් සකස් කර ගිවිසුම් ගතව නොතිබුණි.	. සමස්ත කාර්ය මණ්ඩලය ඇතුළත් ව කාර්ය සාධන ගිවිසුම් සකස් කර ගිවිසුම්ගතව පවත්වාගෙන යාමට අවශ්‍ය කටයුතු සිදුකළ යුතු වුවත්, මෙම අමාත්‍යාශයේ වාර්ෂිකව කාර්ය සාධන ගිවිසුම් සකස් කිරීමක් සිදු වී නොමැති බැවින්, ඒ සම්බන්ධයෙන් අධ්‍යයනයක් සිදු කර කාර්ය සාධන ගිවිසුම් සකස් කිරීමට අපේක්ෂා කෙරේ.
මානව සම්පත් සංවර්ධන සැලැසුම් සකස් කිරීමට ද ධාරිතා හා නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට ආයතනය තුළ ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු නම් කර නොතිබුණි. සැලසුම්ගත පුහුණු අවස්ථාවලින් ලබා දී තිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය 50% ට වඩා අඩු මට්ටමක පැවතුණි.	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 02/2018 ට අනුකූලව මානව සම්පත් සංවර්ධන සැලැස්ම සකස් කර ඇත. මානව සම්පත් සංවර්ධන සැලසුම් සකස් කිරීමට ද ධාරිතා හා නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට ආයතනයේ ජ්‍යෙෂ්ඨ නිලධාරියෙක් නම් කර ඇත. කොවිඩ් 19 වසංගතය හමුවේ මානව සම්පත් සංවර්ධන කටයුතුවලට අදාලව සැලසුම්ගත පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම ප්‍රායෝගිකව සිදු කිරීම අදාල කාල වකවානුව තුළ ගැටළුකාරී වීමත්, පසුකාලීනව මුදල් අමාත්‍යාංශය මගින් නිකුත් කර ඇති 2022.04.26 දිනැති ජාතික අයවැය චක්‍රලේඛ අංක 03/2022 මගින් රාජ්‍ය වියදම් පාලනය කිරීමට අදාලව සිදුකරන ලද සීමා කිරීම් හේතුවෙන් සැලසුම්ගත පුහුණු වැඩසටහන්වල සංශෝධනයන් සිදු කිරීමටත්, යම් යම් පුහුණු වැඩසටහන් අත්හිටුවීමටත් සිදු විය. නමුත් 2023 වර්ෂය සඳහා සැලසුම් කළ පරිදි පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිතය.

වෛද්‍ය අනිල් ජාසිංහ
ලේකම්